**කතරගම ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**

**------------------------------**

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 25 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 23 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 29 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කතරගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

**(අ)** **<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------------- | --------------- | -------------------- |
| (i) | සමාලෝචිත වර්ෂයේදී ජ'නල් සටහන් අංක 72 මගින් සාවද්‍ය ලෙසට සමුච්චිත අරමුදල් ගිණුම රු. 2,868,666 ක් හරකර රථගාල් ගාස්තු ගිණුම රු. 2,868,666 ක් බැර කර තිබුණු බැවින් වර්ෂයේ ආදායම එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2020 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන විට ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට විෂයභාර නිලධාරී වෙත උපදෙස් ලබාදුන් බව දන්වමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය තුල සභාවට ලැබී තිබුණු රු.1,314,900 ක් වටිනාකමැති ට්‍රැක්ටර් රථයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ට්‍රැක්ටර් රථයේ වටිනාකම ප්‍රාග්ධනිත කිරීමට විෂයභාර නිලධාරී වෙත උපදෙස් ලබාදුන් බව දන්වමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයට අදාළ රු.415,047 ක වියදම් සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | රු. 415,047 ක මුදල ගිණුම්ගත කර නිවැරදි කර ගැනීමට විෂයභාර නිලධාරී වෙත උපදෙස් ලබාදුන් බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාගයක් ලෙසට ලැබී තිබුණු රු. 325,000 ක් වටිනා ට්‍රැක්ටර් ට්‍රේලරය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | අදාළ ගිණුම් නිවැරදි කිරීමට ගිණුම් විෂයභාර නිලධාරී වෙත උපදෙස් ලබා දුන් බව දන්වමි. |
| (v) | සමාලෝචිත වර්ෂයේදී ඉදිකිරීම් සඳහා වැයකළ රු. 147,000 ක් ප්‍රාග්ධනගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | අදාළ ගිණුම් නිවැරදි කිරීමට ගිණුම් විෂයභාර නිලධාරී වෙත උපදෙස් ලබා දුන් බව දන්වමි. |
| (vi) | සභාවේ හිටපු ලේකම්ට 2019 නොවැම්බර් සහ දෙසැම්බර් මාස සඳහා වැඩ බැලීමේ දීමනා ලෙස ගෙවා තිබුණු පළාත් සභාවෙන් ප්‍රතිපූර්ණය කරගත යුතු රු. 109,376 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ගෙවූ මුදල වෙනුවෙන් ණයගැති ප්‍රතිපාදන වෙන්කිරීමට විෂයභාර නිලධාරී වෙත උපදෙස් ලබා දුන් බව දන්වමි. |

**(ආ) <u>විගණනය සඳහා සාක්ෂි නොවීම්</u>**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ------------------------ | -------------- | -------------------- |
| රු. 127,377,806 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් තක්සේරු වාර්තාද, රු. 9,605,513 ක් වූ හිඟ වරිපනම් බදු සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ වාර්තාද, රු. 6,351,392 ක් වූ හිඟ වෙළඳ ස්ථාන කුළී සම්බන්ධයෙන් අයවිය යුතු පාර්ශවයන් පිළිබඳ විස්තර හා රු. 17,385,512 ක ගෙවිය යුතු තැන්පතු ශේෂ 4 ක් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | වෘත්තීය තක්සේරුකරුවන් ගේ වාර්තා කඩිනමින් ලබා ගන්නා ලෙසද, හිඟ කුලී අයකර ගන්නා ලෙසද, කාල විශ්ලේෂණ වාර්තාවක් කඩිනමින් ලබාදෙන ලෙසද විෂයභාර නිලධාරී වෙත උපදෙස් ලබා දුන් බව දන්වමි. |

**1. 4** <u>අනුකූල නොවීම්</u>

<u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>

| නීති, රීති හා රෙගුලාසි යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) 21(2) වගන්තිය | සභාවට අයත් මාර්ග හඳුනාගෙන ගැසට් පත්‍රයේ පල කිරීමට කටයුතු කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සභාව සතු මාර්ග හඳුනා ගනිමින් පවතින අතර එය නිම වූ පසු ගැසට් පත්‍රයේ පල කිරීමට කටයුතු කරමි. |
| (ii) 24(1) (ආ) වගන්තිය | සභාවට අයත් පාරවල් සහ පටු මංමාවත් වෙනුවෙන් මාර්ග ඉන්වෙන්ට්‍රියක් පවත්වාගෙන නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේදී මාර්ග ඉන්වෙන්ට්‍රිය සකස් කරන ලෙසට විෂයභාර නිලධාරි දැනුවත් කළ බව දන්වමි. |
| (iii) 132 වගන්තිය | 2019 වර්ෂයට අදාල සභාවේ අයවැය ලේඛනය සම්මතවීම වෙනුවෙන් පෞද්ගලික හෝටලයක සාදයක් පවත්වා සභා අරමුදලින් රු. 146,250 ක් ගෙවා තිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගත් අතර මිල ගණන් කැඳවා ආහාර ලබාගෙන ගෙවීම් සිදු කළ බව දන්වමි. |
| (iv) 158,162 හා 163 වගන්ති | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 9,605,513 ක හිඟ වරිපනම් බදු අයකරගෙන නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට විෂයභාර නිලධාරී වෙත උපදෙස් ලබාදුන් බව දන්වමි. |
| (ආ) 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන | 2014,2015 හා 2016 වර්ෂවල දී අනුමත කර තිබුණු ගොඩනැගිලි සැලසුම් 124 කට අදාළව | ඉදිකිරීම් පරීක්ෂා කර අනුකූලතා සහතික නිකුත් | ගොඩනැගිලි අයිතිකරුවන් ලිපි මගින් |

| | | | |
|---|---|---|---|
| අති විශේෂ ගැසට් පත්‍රය | අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. | කළ යුතුවේ. | දැනුවත්කර අනුකූලතා සහතික නිකුත් කරමින් පවතින බව දන්වමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 7,648,306 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 7,946,000 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්පත් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 10,419,400 | 8,351,971 | 4,925,877 | 3,426,094 | 8,119,400 | 8,274,133 | 4,851,519 | 3,422,614 |
| (ii) | කුලී | 16,208,600 | 8,019,092 | 7,817,362 | 201,730 | 14,440,900 | 11,975,699 | 11,859,098 | 116,601 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 951,500 | 1,682,450 | 1,682,450 | - | 967,600 | 1,374,100 | 1,374,100 | - |
| (iv) | වෙනත් ආදායම් | 26,848,232 | 26,293,678 | 19,124,918 | 7,168,760 | 19,827,100 | 22,088,007 | 14,189,350 | 7,898,657 |
| | එකතුව | 54,427,732 | 44,347,191 | 33,550,607 | 10,796,584 | 43,355,000 | 43,711,939 | 32,274,067 | 11,437,872 |

**2.2.2 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) වරිපනම් බදු** | | |
| (i) සමාලෝචිත වර්ෂයට බිල් කරන ලද රු. 6,210,807 ක් වූ වරිපනම් බදු ආදායමින් දෙසැම්බර් 31 දිනට රු. 3,426,094 ක් රැස්කර නොතිබුණු අතර එය මුළු බිල් කළ වටිනාකමින් සියයට 55 ක් විය. | හිඟ වරිපනම් බදු අයකර ගත යුතුවේ. | හිඟ වරිපනම් බදු කඩිනමින් අයකර ගන්නා ලෙසට හා ඒ පිළිබඳව වාර්තාවක් ලබාදෙන ලෙසට විෂයභාර නිලධාරිට උපදෙස් ලබාදුන් බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පැවති රු. 7,259,127 ක් වූ හිඟ වරිපනම් බදු ආදායමින් වර්ෂය තුලදී රු. 6,179,419 ක් අයකරගෙන නොතිබුණි. එම අය නොකල මුදල වර්ෂය ආරම්භයේ පැවති හිඟ වරිපනම් මුදලින් සියයට 85 ක් විය. | හිඟ වරිපනම් බදු අයකර ගත යුතුවේ. | හිඟ වරිපනම් බදු කඩිනමින් අයකර ගන්නා ලෙසට හා ඒ පිළිබඳව වාර්තාවක් ලබාදෙන ලෙසට විෂයභාර නිලධාරි වෙත උපදෙස් ලබාදුන් බව දන්වමි. |

**(ආ)** <u>හිඟ දේපල බදු</u>

| | | |
|---|---|---|
| සභාවට අයත් දේපල බදුදීම වෙනුවෙන් 2017 සහ 2018 වර්ෂවලට අදාල රු. 6,413,306 ක සහ සමාලෝචිත වර්ෂයට අදාල රු. 831,828 ක බදු අයකරගෙන නොතිබුණි. | හිඟ දේපල බදු ආදායම් අයකර ගත යුතුවේ. | සියළුම හිඟ දේපල බදු අයකර ගැනීමට විෂයභාර නිලධාරි වෙත උපදෙස් ලබාදුන් බව දන්වමි. |

**2.2.3** <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| -------------------------- | ------------- | ------------------ |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු උසාවි දඩ රු. 1,338,751 ක් හා මුද්දර ගාස්තුව රු. 3,211,992 ක් අයකර නොතිබුණි. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකරගත යුතුවේ. | 2019 වර්ෂය වෙනුවෙන් අයවිය යුතු මුදල් අයකර ගෙන ඇති බව දන්වමි. |

**3.** <u>**මෙහෙයුම් සමාලෝචනය**</u>

**3.1** <u>**කාර්ය සාධනය**</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** <u>**අතුරු ව්‍යවස්ථා**</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| -------------------------- | ------------- | ------------------ |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට ඉන් කාරණා 7 ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | 2015 දෙසැම්බර් 07 දිනැති අංක 1944/22 දරන IV (ආ)පළාත් පාලන ගැසට් පත්‍රයේ පලකර ඇති අතුරු ව්‍යවස්ථා 23 ක් වැළඳගෙන ඇති බව දන්වමි. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබුණු අතර ඒ අනුව වර්ෂයේ ළඟාකර ගැනීමට අවශ්‍ය අරමුණු සහ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් හඳුනාගෙන නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් නොකළ බවද, 2020 වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට විෂයභාර නිලධාරි වෙත උපදෙස් ලබා දුන් බව දන්වමි. |

(ඇ) තිරසර සංවර්ධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | දර්ශක හඳුනාගැනීම සිදු කරමින් පවතින බවද, ඒ පිළිබඳ වාර්තාවක් සපයන ලෙසට උපදෙස් ලබා දුන් බව දන්වමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ලැබිය යුතු ගිණුම් | | |
| මූලාා ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.1,604,560 ක හිඟ හිටි පොදු වෙළඳපොළ කුලී සහ හිඟ හිටි කඩකාමර කුලී අයකරගෙන නොතිබුණු අතර ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක්ද ඉදිරිපත් නොකෙරුණි. | අයවිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අයවිය යුතු පාර්ශවයන් හඳුනාගෙන කාල විශ්ලේෂණ පිළියෙල කර අයකර ගැනීමට විෂයභාර නිලධාරී වෙත උපදෙස් ලබා දුන් බව දන්වමි. |

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

| | | |
|---|---|---|
| වසර 1 කට අධික කාලයක සිට පැවත එන ගෙවිය යුතු එකතු කළ අගය මත බදු රු. 4,319,539 ක් ද නිරවුල් කර නොතිබුණි | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ගෙවිය යුතු මුදල කඩිනමින් නිරවුල් කිරීමට විෂයභාර නිලධාරි වෙත උපදෙස් ලබා දුන් බව දන්වමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------------- | -------------- | ------------------- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 03 කට අදාළව සේවක අතිරික්ත 18 ක් සහ තනතුරු 13 කට අදාලව පුරප්පාඩු 26 ක් පැවතුණි. | අතිරික්ත තනතුරු අනුමත කරගත යුතු අතර පුරප්පාඩු පුරවාගත යුතුවේ. | අතිරික්ත තනතුරු සඳහා අනුමැතිය ලබාගෙන ඇත. පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය අනුමැතිය ලැබී ඇති අතර, බඳවා ගැනීම් 2019 නොවැම්බර් 20 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ ලිපිය මගින් තාවකාලිකව නතර කර ඇති බව දන්වමි. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------------- | -------------- | ------------------- |
| **කඩකාමර තක්සේරු කුලී**<br>සභාව විසින් දීර්ඝකාලීනව බදුදී තිබුණු කඩකාමර 200 ක මාසික බදු කුලිය අය කිරීමේදී, ඌව හා නැගෙනහිර පළාත් ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව අනුව කටයුතු කර නොතිබීම නිසා සමාලොචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභා අරමුදලට රු. 23,542,350 ක ආදායමක් අහිමි වී තිබුණි. | තක්සේරු කුලිය අයකරගත යුතුවේ. | හිඟ කුලී මුදල් අයකර ගැනීමට විෂයභාර නිලධාරි වෙත උපදෙස් ලබා දුන් බව දන්වමි. |

**3.5** **වත්කම් කළමනාකරණය**

**3.5.1** **වාහන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) වාහන හා යන්ත්‍රෝපකරණවල නීත්‍යානුකූල අයිතිය පවරා නොගැනීම** | | |
| 2001 වර්ෂයේ සිට 2016 දක්වා කාල පරිච්ඡේදය තුළ ලැබී තිබුණු වාහන/යන්ත්‍ර 06 ක නීත්‍යානුකූල අයිතිය සභාවට පවරාගෙන නොතිබුණි. | වාහනවල නීත්‍යානුකූල අයිතිය පවරා ගත යුතුවේ. | අයිතිය පවරා ගැනීමට විෂයභාර නිලධාරී වෙත උපදෙස් ලබා දුන් බව දන්වමි. |
| **(ආ) ඇස්තමේන්තු සහ නිමි වැඩ වාර්තා පිළියෙල නොකිරීම** | | |
| සභාවට අයත් යන්ත්‍ර 2ක් 2019 ජනවාරි 01 සිට 2019 අගෝස්තු 31 දක්වා කාල පරිච්ඡේදය තුළදී මීටර් පැය 718.3 ක් ධාවනය කර, කර්මාන්ත 119 ක් ඉටුකළ බව දෛනික ධාවන සටහන්වල දක්වා රු. 549,313 ක ඉන්ධන වියදමක් දරා තිබුණද ඇස්තමේන්තු සහ නිමි වැඩ වාර්තා පිළියෙල කර නොතිබුණි. | ඇස්තමේන්තු හා නිමි වැඩ වාර්තා පිළියෙල කළ යුතුවේ. | ඇස්තමේන්තු හා නිමි වැඩ වාර්තා පිළියෙල කරන ලෙසට විෂයභාර නිලධාරී වෙත උපදෙස් ලබා දුන් බව දන්වමි. |
| **(ඇ) දෛනික ධාවන සටහන් පිළියෙල කිරීම** | | |
| සභාවට අයත් වාහන/යන්ත්‍ර 02 ක් 2019 පෙබරවාරි 18 දින සිට අගෝස්තු 31 දින දක්වා කාල පරිච්ඡේදය තුළදී ධාවනය කිරීමට රු. 608,162 ක් වැයකර ඉන්ධන ලීටර 5715 ක් යොදා තිබුණි. එහෙත් එම කාලය සඳහා දෛනික ධාවන සටහන් ලියා නොතිබුණි. | ධාවන සටහන් කාලීනව පිළියෙල කළ යුතුවේ. | ධාවන සටහන් පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස විෂයභාර නිලධාරී වෙත උපදෙස් ලබා දුන් බව දන්වමි. |
| (ඈ) සභාවට අයත් වාහන 2 ක් පිළිවෙලින් වසර 4ක සහ වසර 13 ක සිට භාවිතයෙන් පසු ඉවත්කර තිබුණු අතර ඒවා 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධි විධාන පරිදි අපහරණය කිරීමට කටයුතුකර නොතිබුණි. | භාවිතයෙන් ඉවත් කළ වාහන චක්‍රලේඛ විධි විධාන පරිදි අපහරණය කළ යුතුවේ. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කරන ලෙසට විෂයභාර නිලධාරී වෙත උපදෙස් ලබා දුන් බව දන්වමි. |

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකල යුතුවේ. | 2019 වර්ෂයේදී අභ්‍යන්තර විගණන නිලධාරියකු පත්කළ අතර ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව දන්වමි. |

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවිය යුතුවේ. | 2020 ජනවාරි මස විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පැවැත්වූ අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව දන්වමි. |